# ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශනය
# 2016 නත්තල

ජේසුතුමාගේ උපත 'නත්තල් උත්සවය' ලෙස සාමාන්‍යයෙන් පවත්වන අතර එය මූලික වශයෙන් "බලාපොරොත්තුවේ" පණිවුඩය සිහි කැඳවයි. **කිතු උපත සිදු වුවේ** දේශපාලන, ආර්ථික සමාජයීය සහ ආගමික නිදහසක් නොමැති ව ජීවන බර යටතේ තාඩන පීඩනයට ලක් ව පාගා දැමුවා වූ දුප්පතුන්, එම පච්කාර දුක්ඛිත වහල් භාවයෙන් ගළවා ගැනීමට "පොරොන්දු **මෙසියස්**" ගේ ආගමනය දැඩි ආශාවෙන් බලාපොරොත්තු වූ සන්දර්භයක් තුලය. ඉතිහාසය පුරාවටම මෙම "බලාපොරොත්තුවේ" උත්තරීතර සංකල්පය නිරන්තරව පැවතුනි.

පශ්චාත් යුධ සන්ධර්භයක ජීවත් වන ශ්‍රී ලාංකිකයන් හට "බලාපොරොත්තුව" ඉතාමත් ම අදාල වන්නේ, අරගලයේ ආලෝකය මගින් ජීවත්වීමට ඇති අයිතිය තහවුරු වන බව උස් හඬින්, පැහැදිලිව ප්‍රකාශ වන විටයි. මන්ද යත් **නත්තලේ අරුත පිටුපස "බලාපොරොත්තුවක්" පවතියි. කිතු උපත ඉමහත් ප්‍රීතියෙන් කිතුනුවන් පවත්වන අතර ඔවුන්ගෙ අසල්වාසීන් හට ද තමුන් සමඟ නත්තල සැමරීමට ආරාධනය කරනු ලබයි. එනමුත් අධික වෙළඳ ප්‍රචාරනයන් තුලින් ඇතිකරන්නා වූ ව්‍යාජ විනෝදවීම්, නත්තල් සැරසිල්වල බාහිර ආටෝපය සඳහා පමන ඉක්මවා වියදම් කිරීම නිසාම නත්තලේ සැබෑ වටිනාකම සහ හරය යටපත් වී නත්තල වානිජකරණය කිරීමේ ප්‍රවනතාවයට නැතහොත් තර්ජනයට එරෙහිව අවවාදාත්මකව හඬ අවදි කිරිම ඉතාමත් කාලෝචිත ය.** නත්තල සැමරුම අතරම මදක් නැවතී මේ කාලය තුළදී වේදනාවෙන් දුක් විඳින්නන්ගේ අඳෝනාවලට ඇහුම්කන් දී ඒවා ගැන සැළකිළිමත් වන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටීමට අපි කැමැත්තෙමු.

නත්තල සැමරීම සඳහා අළුතින්ම එකතුකරන ලද්දා වූ ගාළු මුවදොර පිටියේ ඉදිකිරීමට යන 'ලොව උසම නත්තල් ගස' පිළිබඳව සැලවීමෙන් අප කනගාටුවට පත් වී ඇත්තෙමු.

වඩාත් තැතිගන්වන සුළු සහ අවුල්සහගත කාරනය නම් මෙම යෝධ නත්තල් ගස මන මෝහනයෙන් සහ උත්කර්ෂයෙන් තැබීම සහ තබන්නාවූ ස්ථානය චේතාන්විතව සහ විචක්ෂනව වරාය නගර සංවර්ධනයේ තිබෙන මානව පාපයේ ආඩම්බරය සැඟවීමයි. මෙම සංවර්ධන ව්‍යාපෘතිය බරපතල ප්‍රශ්න මතුකරනු ලබනු අතර එය පරිසරයට ජීවනෝපායන්ට සහ අප ජනතාව අවතැන් කිරිම දක්වා බරපතල විපාක ඇති කරනු ඇත.

මෙම පසුතලයට එරෙහිව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සියලු ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ ජේසුතුමාගේ උපත ප්‍රීතියෙන් නමුත් දේව වචනයයේ මුල් බැස, එයින් මගපෙන්වීම ලබා සැබෑ අධ්‍යාත්මය සහ පාරිශුද්ධත්වය පිළිබඳව අවබෝධයෙන් යුතුව සිහිපත් කරන ලෙස සහ සමරන ලෙසයි.

***'රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේය, එය ඔබට සලකුණ '*** *යැයි කීය.* ***ලූක් 2:12***

එබැවින් උන්වහන්සේ සොයාගත හැකි තැන් හී අපි ස්වාමින් වහන්සේව සොයමු. අධිකතම වු විනෝදවීම් හා අනවශ්‍ය වියහියදම් තුල නොවේ, ගාලු මුවදොර ඇති පලුදු වූ නත්තල් ගසේත් නොවේ, මහා විශාල දේව මාළිගා සහ රාජ මාළිගා තුළද නොවේ, උන්වහන්සේව සොයාගත හැක්කේ මානව අදමිටු බවෙන් පිටමන් කරන ලද ගව ඔරු තුළ සහ නිසි අභිමානයෙන් යුතුව ජිවත්වන්නට බලාපොරොත්තුවෙන් සිටින පහලට හෙලන ලද්දවුන්, දුප්පතුන්, පරිදියට බැහැර කරන ලද්දවුන් සමඟ සහයෝගීතාවයෙන් යුක්තවය.

අත්සන් තබනු ලැබුවේ:

ගෞරවණීය සමන් පෙරේරා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රෙස්බිටේරියන් සභාව,
අති ගෞරවණීය ඩී. ආර්. කනගසබේ - කොළඹ රදගුරු, ලංකා සභාවේ කොළඹ දියෝකීසිය,
අති ගෞරවණීය ආචාර්‍යය ඩැනියෙල් එස්. ත්‍යාගරාජා යාපනය දියෝකීසියේ රදගුරුතුමා,
වන්දනීය නිමල් වික්‍රමරත්න - අනුනායක ලංකා සභාවේ කුරුණෑගල දියෝකීසිය,
ගෞරවණීය ආසිරි පී. පෙරේරා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකාවේ මෙතොදිස්ත සභාව,
ගෞරවණීය ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා බැප්ටිස්ට සංගමය,
ගෞරවණීය ස්ටැන්ලි නෙල්සන් සභාපති - ක්‍රිස්තියානි රෙපරමාදු සභාව,
කර්නල් ඇලිස්ටෙයාර් වෙන්ටර්, ප්‍රාදේශීය මූලික, ගැලවීමේ හමුදාව,
ගෞරවණීය ජී. නඩරාජා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා ලුතරන් සභාව,
ගෞරවණීය ලෙස්ලි කීගල් දේවගැතිතුමා -සභාපති, සිව් චතතුරස්‍ර සභාව,
ගෞරවණීය මයිකල් දිසානායක දේවගැතිතුමා - සභාපති, ලංකා දේව සභා සංගමය,
ගරු. ඩබ්ලිව් පී එබනේසර් ජෝසෆ් දේවගැතිතුමා මහ ලේකම් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය පහත සඳහන් සාමයික සංවිධානද නියෝජනය කරන්නේය:

- තරුණ ක්‍රිස්තියානි සංගමය
- තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය
- ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපාරය
- ශ්‍රී ලංකා බයිබල් සමාගම
- ශ්‍රී ලංකා ක්‍රිස්තියානි සාහිත්‍ය සමාගම
- ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය
- ජීවිතාලෝකය
- කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය
- යෞවන කිතුමග